# පුරාවස්තු විනාශය කෙරෙහි බලපාන හේතු සාධක පිළිබඳ අධ්‍යයනයක්

## (පොළොන්නරු දිස්ත්‍රික්කයේ පුරාවස්තු විනාශය පිළිබඳ නූතන නිදසුන් කිහිපයක් ඇසුරෙනි)

සමීර ප්‍රසංග[1], චමල් සේනාධීර[2], කසුන් දර්ශිත[3], ක්‍රිෂේන් මෙන්ඩිස්[4]

### හැඳින්වීම හා අරමුණු

පුරාවස්තු විනාශය; ජාතියක් ලෙස වර්තමානයේ අප මුහුණ දී ඇති බරපතල ව්‍යසනයකි. කොතරම් නීතිරීති පැවතිය ද ඒ සියල්ල අභිබවමින් පුරාවස්තු මංකොල්ලකරුවන් සිය පරමාර්ථ මුදුන් පමුණුවා ගෙන තිබෙයි. මේ සඳහා විවිධ හේතු සාධක බලපා ඇත.මෙම පර්යේෂණයේ මූලික අරමුණ වනුයේ එවැනි පසුබිමක් ගොඩනැගීම කෙරෙහි ඉවහල් වී ඇති හේතු කිහිපයක් පිළිබඳ අවධානය යොමු කිරීම හා දැඩි ව්‍යසනයකට මුහුණ දී ඇති එවැනි පුරාවිද්‍යා ස්ථාන කිහිපයක් පිළිබඳ සමාජ ගත කිරීමයි. නියැදියක් ලෙස පොළොන්නරු දිස්ත්‍රික්කය තෝරා ගනිමින් පර්යේෂණය සිදු කරන ලදි.මේ සඳහා දැඩිව්‍යසනයකටබඳුන් වූ ස්ථාන හතරක් යොදා ගත්තේ ය. මුතුගල, කන්දේගම, මෝලාහිටියහා මානික්කන්පට්ටිය යනු එම ස්ථාන හතරයි.

### ක්‍රමවේදය

ස්ථානීය ගවේෂණමගින් තොරතුරු රැස් කිරීම ප්‍රධාන පර්යේෂණ ක්‍රමවේදය ලෙස යොදා ගන්නා ලදි. එහි දී එක් එක් ස්ථානවලපුරාවස්තු විනාශය පිළිබඳතතුදත් අයගෙන් ද කරුණු විමසීමට පියවර ගන්නා ලදි. ස්ථානීය ගවේෂණ හා සාකච්ඡා පදනම් කර ගනිමින් රැස් කර ගත් දත්ත සමාලෝචනය සඳහා පදනම් කර ගන්නා ලදි.

### සාකච්ඡාව

පුරාවස්තු මංකොල්ලකරුවන්ගේ දැඩි ග්‍රහණයට නතු වී පවතින විහාර සංකීර්ණ අතුරින් එකක් වනුයේ වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් මුතුගලයි. කොළඹ සිට පොළොන්නරුව හරහා මඩකලපුව දක්වා වැටී ඇති මාර්ගයේ සෙවනපිටියෙන් වමට හැරීකිලෝමීටර් හයක් පමණ ගමන් කළ විට මෙම විහාර සංකීර්ණයට පිවිසිය හැකි වේ. වර්තමානයේ මෙය ජල ගැලුම් නිම්න ජාතික වනෝද්‍යානය තුළ පිහිටා තිබේ. මහවැලි ගංගාවේ දකුණු ඉවුරේපිටාර

---

[1] කොළඹ විශ්වවිද්‍යාලය
[2] කොළඹ විශ්වවිද්‍යාලය
[3] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
[4] ඇක්වයිනාස් යුනිවර්සිටි කොලේජ්, කොළඹ

කලාපයට අයත් විශාල ස්වභාවික විලක දකුණු මායිමේ ඇති පර්වත තුනක් පදනම් කර ගනිමින් විහාරය සංකීර්ණය ගොඩනැඟී තිබේ.හඳුනා ගැනීමේ පහසුව සඳහා පර්වත 1, 2, 3 ලෙස නම් කරමු. විහාර සංකීර්ණය සඳහා ප්‍රවේශ වන පර්වතය අංක 1 ලෙස හඳුන්වනු ලැබේ. මෙහි ස්තූප දෙකක නටබුන් හා තවත් ගොඩනැගිලි දෙකක නටබුන් පැහැදිලිව දැක ගත හැකි ය. ස්තූප දෙක ම ඉතා දැඩි ලෙස පුරාවස්තු මංකොල්ලකරුවන්ගේ ග්‍රහණයට හසු වී තිබේ. පර්වතයේ උතුරු බෑවුමට ආසන්නව පිහිටි ස්තූපයේ ඉහළ මධ්‍යයේ අඩි 15ක පමණ ගැඹුරට දිවෙන පරිදි වළකි. එම ස්තූපයට යාබදව නැගෙනහිරින් පිහිටි ස්තූපයේ ද ඉහළ මධ්‍යයේ සිට අඩි 12ක් පමණ ගැඹුරට හාරා විනාශ කර ඇත. හැරීමේ දී පිටතට ගත් ගඩොල් පර්වතය පුරා විසිරී පවතියි. එම ස්ථානයෙහි පිහිටි අනෙකුත් ගොඩනැගිලිවල සඳකඩපහණ මෙන් ම ගොඩනැගිලි පාදම් ද මුළුමණින් ම පාහේ කඩාබිඳ දමා තිබේ. මුතුගල විහාර සංකීර්ණයේ අංක 2 දරණ පර්වතය ස්වභාවික ලෙන්වලින් ගහණය. මේවා ක්‍රිස්තු පූර්ව තෙවන සියවස තරම් ඈත කාලයක සිට භික්ෂූන්ගේ වාසස්ථාන ලෙස පැවති බවට කටාරමට පහළින් කොටා ඇති පූර්ව බ්‍රාහ්මී ලිපි මගින් සනාථය. අංක 2 පර්වතය මධ්‍යයේ ඇති ලෙනක අඩි 15ක් පමණ ගැඹුරු වළක් කැණතිබේ. ඊට ඉහළින් ඇති ලෙනෙහි වූ සැතපෙන බුදුපිළිමය මංකොල්ලකරුවන් විසින් සම්පූර්ණයෙන් ම පාහේ බිඳ දමා ඇත. අංක 3 පර්වත මුදුනෙහි දැකිය හැකි ස්තූපය ද අඩි 12ක් පමණ ගැඹුරට හාරා තිබෙනු පෙනෙයි.

දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් කන්දේගම ධනංජය රජමහා විහාරය මෙවැනි  විනාශයකට ගොදුරු වී ඇති තවත් සිද්ධස්ථානයකි. පොළොන්නරුවේ සිට අරලගංවිල හරහා අම්පාර දක්වා වැටී ඇති මාර්ගයේ මාදුරු ඔය ජලාශයට වඩාත් සමීපව කන්දේගමධනංජය රජ මහා විහාරය පිහිටාතිබේ. පුදබිමට අයත් අක්කර 1845කට ආසන්න භූමි භාගයක් පුරාවිද්‍යා රක්ෂිතයක් ලෙස ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කර ඇත.මෙහි පර්වත හතක් පදනම් කර ගනිමින් නටබුන් විශාල සංඛ්‍යාවක් විසිරී තිබේ. වර්තමාන ආවාස ගෙය අසළින් පියනැගිය හැකි කඳු ගැටය මුදුණේ පිහිටි දැකුම් කළු සැතපෙන බුදුපිළිමයකි.මෙයමංකොල්ලකරුවන්ගේ ග්‍රහණයට හසු වී විනාශයට ලක් ව තිබෙයි. බුදුපිළිමයේහිස හා ළය පෙදෙස් බිඳ දමා තිබේ. සැතපෙන බුදුපිළිමය සහිත ලෙන වෙත ගමන් ගන්නා මාර්ගයේ දැකිය හැකි පූර්ව බ්‍රාහ්මී ලිපියක් සහිත ලෙනක ලිපිය කෙළවර ඇති බ්‍රාහ්මී නොවන සංකේත සහිත කොටසට එක එල්ලේ පොළොව හාරා විනාශ කර දමා ඇත. වර්තමාන ආවාසයට දකුණු දෙසින් පිහිටි කුඩා ස්තූපය ද මංකොල්ලකරුවන්ගේ දැඩි තර්ජනයට ලක් වී ඇත. එහි ඉහළ මධ්‍යයේ අඩි 20ක් පමණ ගැඹුරින් යුතු වළකි.

දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් මෝලාහිටිය විහාර සංකීර්ණය පරණවිතාන වැනි උගතුන්ගේ ද ඇස ගැටුණු ස්ථානයකි. මෙය වඩාත්

ජනප්‍රියව ඇත්තේ එහි පවතින සෙල් ලිපි ත්‍රිත්වය හේතුවෙනි. ඉන් එකක් කුටකණ්ණතිස්ස රජුගේ වැඩිමහලු පුත් වූ භාතිකාභය රජුගේ ය. අනෙක ඔහුගේ මබාල පුත් වූ මහාදාඨික මහානාග රජු විසින් ලියන ලද්දක් ය. මෙම ස්ථානය පරණවිතානයන් හඳුන්වා ඇත්තේ මෝලාහියටිය වෙලේගල යනුවෙනි. දිඹුලාගල විහාරය ඉදිරියෙන් වැටී ඇති බිම්පොකුණ මාර්ගයේ කිලෝමීටර් දෙකක් පමණ ගමන් කිරීමෙන් පසු හමු වන මිල්ලාන හන්දියෙන් වමට හැරී කිලෝමීටරයක් පමණ ගමන් කිරීමෙන් පුදබිමට ළඟා විය හැකි ය. දිඹුලාගල පර්වතයේ නැගෙනහිර බෑවුමේ පිහිටි මෝලාහිටිය;අනුරාධපුර අවධිය තරම් ඈතට දිවයන ඉතිහාසයක් සහිත විහාර සංකීර්ණයකි. බටහිර දෙසට නැඹුරුව ඇති පර්වත බෑවුමේ පිහිටිනටබුන් වූ ගොඩනැගිල්ලක් මංකොල්ලකරුවන්ගේ ග්‍රහණයට මුළුමණින් ම පාහේ නතුවඇත. මෙය අෂ්ටාකාර ගොඩනැගිල්ලක් බව විසිරී ඇති පාදම් ගල්වලින් සනාථය. එහි මධ්‍යයේ තිබූ බව පැවසෙන විශාල ගල් ආසනය මේ වන විටත් මංකොල්ලකරුවන් විසින් පෙරළා දමා ගොස් ය. ප්‍රදේශවාසීන්ගේ විශ්වාසය අනුව මෙය මලියදේව මහරහතන් වහන්සේ විසින් අරියවංස දේශනාව පැවැත් වූ මණ්ඩපය බවයි. මෙහි ඇති ප්‍රකට ශිලා ලේඛන ද මංකොල්ලකරුවන්ගේ ග්‍රහණයට නතුවීමට ආසන්නය. පිහිටි පර්වතය ඉක්මණින් කැඩී විනාශ වන පාෂාණයක් බැවින් මංකොල්ලකරුවට පහසුවක් අත් කර දී ඇති බවක් පෙනෙයි. එබැවින් පර්වතයේ තැනින් තැන ඉතා පහසුවෙන් වළවල් කැණ විනාශ කර තිබෙනු දැක ගත හැකි වෙයි.

කඳුරුවෙල නගර ආසන්නයේ ඇති ස්පිල් හන්දියෙන් වමට හැරී කිලෝමීටර් හයක් පමණ ගමන් ගත් විට මානික්කන්පට්ටිය පුදබිම වෙත ළඟා විය හැකි ය. ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් මානික්කන්පට්ටිය විහාර සංකීර්ණය මුස්ලිම්වරුන්ගේ ග්‍රහණයට දැඩි ලෙස නතු වූ සිද්ධස්ථානයකි. ගුවන් සිතියම් නිරීක්ෂණය කිරීමේ දී විහාර සංකීර්ණය පැතිරී ඇති වපසරිය හොඳින් දැක ගැනීමට හැකි වුවත් මේ වන විට පුදබිමට අයත් වන්නේ ස්තූපයක් පමණි. ඒ වටා මුස්ලිම්වරුන් විසින් නිවාස මෙන් ම කඩ කාමර ද ඉදි කර තිබේ. ස්තූපයේ ජේසාවන්ට සවි වන ආකාරයෙන් නිර්මාණය කළ එවැනි ඉදි කිරීම් මේ වන විට ඉවත් කර ඇති නමුත් පුරාවිද්‍යා භූමියට සිදු වී ඇති විනාශය අපමණය.

**නිරීක්ෂණ**

කන්දේගම හා මෝලාහිටිය යන විහාර සංකීර්ණදෙක ම සිංහල ජනයා බහුතරයක් වාසය කරනු ලබන ප්‍රදේශ ඇසුරු කර ගනිමින් පිහිටා තිබේ. මෙම ස්ථාන දෙකෙහි පවතින පුරාවස්තු විනාශ සඳහා මුල් වූවන් සිංහල බෞද්ධ ජනයා බව පැවැත් වූ සාකච්ඡා මගින් අනාවරණය විය. මුතුගල විහාර සංකීර්ණයේ තත්ත්වය මිට වඩා වෙනස් ය. එය පිහිටා ඇත්තේ දෙමළහින්දු බහුතරයක් වාසය කරනු ලබන ගම්මානයක් මධ්‍යයේ ය. එහෙත් කිසි විටෙක දෙමළ ජනයා මෙම

පුරාවස්තුවලට හානි සිදු කරන බවක් අසන්නට නොලැබිණි. විහාර සංකීර්ණයට කිලෝමීටර් තුන හතරක දුරින් පිහිටි සිංහල ජනපදවල වාසය කරනු ලබන පිරිස් මෙම විනාශය සඳහා බොහෝ සෙයින් දායක වී ඇති බව සාකච්ඡා මගින් දැන ගැනීමට ලැබිණි. මානික්කන්පට්ටියෙහි තත්ත්වය මීට වඩා වෙනස් ස්වරූපයක් උසුලයි. එහි වාසය කරනු ලබන මුස්ලිම් ජනයාගෙන් බහුතරය සිංහල හොඳින් කතා කිරීමට පවා නොදත්තවුන් පිරිසකි. පැරණි ගොඩනැගිල්ලක් බව ඔවුන් දන්නා නමුත් ඒ පිළිබඳ ඔවුහු කිසිදු තැකීමක් නොකරති. කරන ලද ක්ෂේත්‍ර ගවේෂණ හා සම්මුඛ සාකච්ඡා මගින් මෙම ස්ථානයන්හි පුරාවස්තු විනාශය සඳහා හේතු සාධක කිහිපයක් බලපා ඇති බවට හඳුනා ගන්නා ලදි.

සමාලෝචනය

සඳහන් කළස්ථාන බොහෝමයක් නරඹන්නන් අතර වඩාත් ප්‍රකට ඒවා නොවීමත් අවුරුද්දේ වැඩි කාලයක් ඉතා හුදෙකලාව පැවතීමත් මිනිස් වාසයෙන් මදක් ඈත් ව වනගත ප්‍රදේශයන්හි පිහිටා තිබීමත්සංවිධානාත්මක නිධන් හාරන්නන්ගේ වැඩිඅවධානයට උක්ත පුදබිම් ගොදුරුවීම කෙරෙහි ඉවහල්ව තිබේ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ස්වභාවික උදාසීනත්වය හා මූල්‍ය ගැටලු ද මේ කෙරෙහි බලපා ඇති බව පෙනෙයි. නීතිය ආරක්ෂා කිරීම සඳහා බැඳී ඇති පොලීසිය වැනි ආයතන ද නිධන් මංකොල්ලකරුවන් සඳහා රැකවරණය ලබා දීම ගැටලු තව තවත් උග්‍රවීමට බලපා ඇත. දේශපාලන අධිකාරය විසින් ගනු ලබන ඇතැම් අත්තනෝමතික තීන්දු තීරණ ද මේ කෙරෙහි තදින් බලපා තිබෙයි. පුරාවස්තුවල ආරක්ෂාව සඳහා පොදු සමාජය විසින් ගොඩනගා ගෙන තිබූ ඇතැම් සංකල්ප හා විශ්වාස බිඳීයාම ද පුරාවස්තු විනාශය කෙරෙහි බෙහෙවින් ඉවහල් වී ඇති බව පෙනෙයි.

ප්‍රමුඛ පදඃ පොළොන්නරුව, පුරාවස්තු මංකොල්ලකරුවන්, පොලීසිය,විශ්වාස, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

ආශ්‍රිත ග්‍රන්ථ

*Inscriptions of Ceylon*, Vol. I.(1970).(Ed.) S. Paranavitana, Colombo: Department of Archeology.

*Epigraphia Zeylanica*, Vol. III,(1933).(Ed.) Don Martino De Zilva Wickremasinhe, H.W. Codringtin, London: Oxford University Press.